දිනමිණ The Dinamina e paper

# යහපත් දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීමේ වගකීම සෑම පක්ෂයකටම පැවරෙනවා

## ● මල්වතු-අස්ගිරි මහ නාහිමිවරු පවසති



මල්වතු පාර්ශ්වයේ මහනායක තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහ නාහිමියෝ මාර්තු 12 ප්‍රකාශනය අනුමත කැරමින් ඊට අත්සන් තැබූ අයුරු. ඡායාරූපය - අසේල කුරුළුවංශ

**අසේල කුරුළුවංශ**

යහපත් දේශපාලන සංස්කෘතියක් රට තුළ ස්ථාපිත කිරීමේ වගකීම සෑම දේශපාලන පක්ෂයකටම පැවරෙන බවත් එහි ප්‍රමුඛතම පියවරක් ලෙස ඉදිරි මැතිවරණවලදී මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්, හොරු, වංචාකාරයින්, අපරාධකාරයින් ඇතුළු සමාජ විරෝධී ක්‍රියාවන්හි නිරත පුද්ගලයින්ට නාමයෝජනා නොදීමට පක්ෂ නායකයින් පියවර ගත යුතු බවත් මල්වතු අස්ගිරි මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දෙනම පැවසූහ.

යහපත් දේශපාලන සංස්කෘතියක් ඇතිකිරීමේ එක් පියවරක් ලෙස නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය මගින් සකස් කළ මාර්තු 12 ප්‍රකාශනයට අත්සන් තබමින් මල්වතු අස්ගිරි මහ නාහිමිවරු පෙරේදා (31) මේ බව කීහ.

අපේක්ෂකයන්ට නාම යෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ සලකා බැලීමට එකඟ වූ මාර්තු 12 ප්‍රකාශනයේ අඩංගු කරුණු අට සම්බන්ධව පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා ඇතුළු පිරිසක් මහ නාහිමිවරු දැනුවත් කිරීමට පැමිණි අවස්ථාවේ උන්වහන්සේ දෙනම මේ බව ප්‍රකාශ කළහ.

නොයෙක් අයථා ක්‍රම මගින් මුදල් ඉපැයූ මේ පුද්ගලයින් දේශපාලනයට පිවිස එහි ඇති බලය උපයෝගී කැර ගනිමින් තව තවත් විෂමාචාර සිදුකරන බවත් එවැනි පිරිස් දේශපාලනයට ඒම වැළැක්වීම සඳහා අවශ්‍ය බාධකය පක්ෂ නායකයින් විසින් දමන්නේ නම් ගැටලු බොහොමයක් නිරාකරණය වන බවද උන්වහන්සේ දෙනම කීහ.

පවතින මැතිවරණ ක්‍රමය වෙනසකට ලක්කැර ආසන ක්‍රමය හඳුන්වාදීමෙන්ද යම් ප්‍රමාණයකට දූෂිත පුද්ගලයින් මහජන නියෝජිතයින් ලෙස පත්වීම වැළකෙනු ඇති බව ද මහ නාහිමිවරු පැවසූහ.

රටේ උත්තරීතර වූ නීති සම්පාදනය කරන ව්‍යවස්ථාදායකය තුළ උගත් බුද්ධිමත් අවංක ජනතා සේවයට කැපවූවන් සිටිය යුතු බවද මාර්තු 12 ප්‍රකාශනය අනුව දේශපාලන පක්ෂ හා නායකයින් කටයුතු කළහොත් යහපත් දේශපාලන සංස්කෘතියක් රටේ ස්ථාපිත කිරීම අසීරු නොවන බව ද උන්වහන්සේ දෙනම කීහ.

පැෆරල් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා අදහස් දක්වමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ගෙන ඒමෙන් පමණක් පවතින දේශපාලන සංස්කෘතිය වෙනස් කළ නොහැකි බවත් දූෂිත වංචාකාරී අපරාධවලට සම්බන්ධ වූවන් ස්ත්‍රී දූෂකයන් දේශපාලන ක්ෂේත්‍රයෙන් පන්නා දැමීම මාර්තු 12 ප්‍රකාශනයේ අරමුණ බවත් පැවසුවේය. පාර්ලිමේන්තුවට පත්වන අයට නීති සම්පාදනය, ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ පුළුල් අවබෝධයක් තිබිය යුතු බවත් වර්තමාන පාර්ලිමේන්තුව නියෝජනය කරන ඇතැම් මන්ත්‍රීවරු තමන් නියෝජනය කරන දිස්ත්‍රික්කයෙන් වැඩිම මනාප ලැබ පත්ව ආවත් පාර්ලිමේන්තුව තුළ දෙතුන් වතාවකට වඩා කිසිදු අදහස් දැක්වීමක් සිදුකර නොමැති බවද ඒ මහතා කීය.

මේ ප්‍රකාශනයට අත්සන් කළ පමණින් පක්ෂ නායකයින් මෙයට අනුගතව ක්‍රියාකරනු ඇතැයි විශ්වාස කළ නොහැකි බවත් මේ වෙනුවෙන් දේශපාලන පක්ෂවලට ප්‍රතික්ෂේප කළ නොහැකි ආකාරයේ ජන හඬක් මතුවිය යුතුව තිබෙන බවත් හෙතෙම පැවැසුවේය.

මෙම අවස්ථාවට ජාලිය වැලිවත්ත, රවි කන්දගේ යන මහත්වරු ද සහභාගී වූහ.